# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,755 — 1961 නොවැම්බර 11 වැනි සෙනසුරාදා — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 11 වෙනි නියෝගයෙහි විධිවිධාන අනුව අග්‍රාමාත්‍යවරිය විසින් කරනු ලබන ආඥාවයි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1961 නොවැම්බර 11,
කොළඹ.

### ආඥාව

1. මේ ආඥාව හදිසි (ප්‍රසිද්ධ පෙරහැරවල් හා රැස්වීම්) ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාවෙහි ඇති උපලේඛනයෙහි තත් කාලයෙහි සඳහන් කර ඇති ලංකාවේ යම් ප්‍රදේශයක යම් ප්‍රසිද්ධ පෙරහැරක් හෝ කිසියම් රැස්වීමක් පැවැත්වීම මේ ආඥාව බලයෙහි පවත්නා තෙක් මෙයින් තහනම් කරනු ලැබේ.

එසේ වුවද පහත සඳහන් කොන්දේසි සපුරාලනු ලැබූ පෙරහැරක් හෝ රැස්වීමක් පැවැත්වීම මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානයන්ගෙන් නොවැළැක්විය යුතුය.

(අ) පෙරහැර හෝ රැස්වීම පටන් ගන්නා ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධාරියා හෝ සහකාර සුපිරින්ටෙන්ඩන්ට් වරයකුගේ තත්ත්වයට නො අඩු යම් පොලිස් නිලධාරියකු සිය පරම අභිමතය පරිදි පෙරහැරවල් හෝ රැස්වීම් පැවැත්වීම සඳහා අවසරය දී තිබීම ;

(ආ) පෙරහැරට හෝ රැස්වීමට සහභාගි වන තැනැත්තන්ගේ මුළු ගණන එසේ දෙනු ලැබූ අවසරයෙහි ඒ නිලධාරියා විසින් සඳහන් කරනු ලබන ගණනට අඩු යම් ගණනක් වීම ;

(ඇ) පෙරහැරට හෝ රැස්වීමට බලය දෙන අවසරයෙහි නියමිත කාලය තුළ පෙරහැර පටන් ගැනීම හා විසිර යාම.

### උපලේඛනය

#### ප්‍රදේශ

යාපනය, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාරෙයි යන පාලන දිස්ත්‍රික්ක.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2025—ජේ. ඇන්. ආර් 20197—6,400 (61/11)